ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.05.28 චක්‍රලේඛ අංක 43/2026

සියලු ම දිසා කොමසාරිස්වරුන් වෙත,

## බාලදක්ෂ සමූහ ආශ්‍රිතව පාසල් බාලදක්ෂ සමූපකාර සමිති ආරම්භ කිරීමේ නියාමක ව්‍යාපෘතිය

උක්ත කාරණය ට අදාළව සෑම බාලදක්ෂ දිස්ත්‍රික්කයක ම තෝරාගත් එක් පාසල් බාලදක්ෂ සමූහයක නියාමක ව්‍යාපෘතියක් ලෙස පාසල් බාලදක්ෂ සමූපකාර සමිති ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

එසේ වුව ද බාලදක්ෂ සමූහ සියයකට වඩා ඇති බාලදක්ෂ දිස්ත්‍රික්ක වලින් සමූහ දෙකක් බැගින් තෝරා ගැනේ.

**<u>මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු</u>**

* පාසල් බාලදක්ෂ දරුවන්ට ව්‍යවසායකත්වය පිළිබඳව ප්‍රායෝගික පුහුණුව ලබාදිම.
* පාසල් අධ්‍යාපනයෙන් පසු ජීවන වෘත්තීයක් තෝරා ගැනීමට කුසලතාවයක් ලබා දීම
* බාලදක්ෂ සමූහයන් වෙත මූල්‍යමය ප්‍රතිපාදන උපයා ගැනීමට අවස්ථාවක් උදාකර දීම

ඉදිරි කාලය තුළ සෑම පාසල් බාලදක්ෂ සමූහයක් ආශ්‍රිතව ම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ.

එබැවින් පහත සඳහන් කරුණු පිළිබඳව ඔබ ගේ කඩිනම් අවධානය යොමු කිරීමට කාරුණික වන්න

* තෝරාගත් පාසල් බාලදක්ෂ සමූහයේ ඇති ආධාරක කමිටුව විධිමත්ව යාවත්කාලීන කරවන්න
* සුදුසුකම් ලත් ක්‍රියාශීලි අයෙකු සංවර්ධන අංශය භාර සහකාර දිස්ත්‍රික් බාලදක්ෂ කොමසාරිස් වරයෙකු ලෙස පත් කර ඔහුගේ / ඇයගේ

* නම
* රාජකාරි ස්ථානයේ දුරකථන අංකය
* Whatsap දුරකථන අංකය
* ඊ මේල් ලිපිනය
* නිවසේ දුරකථන අංකය
* පෞද්ගලික ලිපිනය
* රාජකාරි ලිපිනය
* ජංගම දුරකථන අංකය

2026.06.16 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සංවර්ධන අංශය වෙත යොමු කිරීමට කාරුණික වන්න.

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk

සමූපකාර බාලදක්ෂ සංවර්ධන කමිටුවට

* සමූහ ආධාරක කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙක්
* බාලදක්ෂ නායක
* සංවර්ධන අංශය භාර සහාය දිස්ත්‍රික් කොමසාරිස්

අයත්වන අතර එම තොරතුරු ද 2026 .06 .16 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සංවර්ධන අංශය වෙත ලැබීමට සලස්වන්න.

මෙම කාර්යයේ දී ඔබ ගේ අගනා සහාය වෙසෙසින් අපේක්ෂා කරමු.වැඩි විස්තර දැනගැනීම පිණිස පහත සඳහන් දුරකථනයට ඇමතීමට කාරුණික වන්න.

ස්තුතියි ,

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**දේශාන් මිලින්ද ලියනගේ**
**සහාය ප්‍රධාන කොමසාරිස් ( සංවර්ධන )**

**නීතිඥ මනෝජ් නානායක්කාර**
**ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්**

**දේශාන් ලියනගේ - 074 094 9343**

**පිටපත් -** ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික
සහය ප්‍රධාන කොමසාරිස් (සංවර්ධන) - ලිපිගොණුවට